# ශ්‍රී ලංකා පොලිසිය

## පොලිස් කොස්තාපල් තනතුර

ශ්‍රී ලංකා පොලිසියේ ආධුනික පොලිස් කොස්තාපල් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06 යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2024.04.30 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලිසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

තනතුරෙහි පවතින පුරප්පාඩු මත ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම් සිදු කිරීමෙන් අනතුරුව මෙම ගැසට්පත්‍රය අවලංගු වේ.

03. වැටුප් ක්‍රමය - (මාසිකව)

රු. 29,540 - 7x300 - 27 x370 - රු. 41,630

මෙම වැටුප් ගණනය කිරීම රා.ප.ච. 03/2016 අනුව සිදු කර ඇත.

තවද, මෙම නිලධාරීන් 2022.12.15 වැනි දිනැති CRTM 260 RTM 385 පරිදි ලබාදෙනු ලබන දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | |
|---|---|---|
| (අ) | ජීවන වියදම් දීමනාව | රු.12,800.00 |
| (ආ) | රා.ප.ච. 03/2016 අනුව තනතුරට අදාළ 40% දීමනාව | රු. 11,816.00 |
| (ඇ) | දුෂ්කර දීමනාව | රු. 2,000.00 |
| (ඈ) | අන්තර් දීමනාව | රු. 7,500.00 |
| (ඉ) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු. 250.00 |
| (ඊ) | ආහාර හා නවාතැන් දීමනා | රු. 28,800.00 |
| (උ) | සේවා කාලය අනුව වෙනත් දීමනා | |

මෙම දීමනා වලට අමතරව :

(අ) ප්‍රවාහන පහසුකම්
(ආ) නිලධාරීන්ට සුභසාධන වෛද්‍ය පහසුකම් (විදේශ රටකදී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)
(ඇ) සියලුම නිල ඇඳුම් ශ්‍රී ලංකා පොලිසියෙන් සපයනු ලැබේ.
(ඈ) සුදුසුකම් සපුරන නිලධාරීන්ට රාජ්‍ය විශ්ව විද්‍යාල මගින් පවත්වනු ලබන උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමට අවස්ථාව හිමිවේ.
(ඉ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්
(ඊ) රාජකාරි සඳහා ගමන් වියදම් ද, දුෂ්කර සේවය හා විශිෂ්ඨ රාජකාරි සඳහා තෑගි වශයෙන් පොලිස් ත්‍යාග අරමුදලින් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

04. අවශ්‍ය මූලික සුදුසුකම් :

4:1 වයස් සීමාව

*ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-25 ත් අතර විය යුතුය.*

tamilguru.lk